# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පහත සඳහන් පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් 2026.09.04 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. හෙද නිලධාරි (II ශ්‍රේණිය)

**සුදුසුකම් :**

(I) අ.පො.ස (සා.පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

සහ

(II) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනුමත හෙද ප්‍රවීණතා සහතිකය ලබා තිබිය යුතුය.

වැටුප : *UMT 1 (III) රු. 51,095.00 - 7x540፡ 10x640 - 60,575.00 (මාසික)*
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් හා/ හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වයස** : අවුරුදු දහ අටට (18) නොඅඩු සහ හතලිස් පහට (45) නොවැඩි විය යුතුයි.

## 2. මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)

**සුදුසුකම්** :

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත්වී තිබිය යුතුය.

වැටුප : *UMT 1 (III) රු. 51,095.00 - 7x540፡ 10x640 - 60,575.00 (මාසික)*
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් හා/ හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වයස** : අවුරුදු දහ අටට (18) නොඅඩු සහ හතලිස් පහට (45) නොවැඩි විය යුතුයි.

**3. <u>තාක්ෂණික නිලධාරි (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය</u>**

**සුදුසුකම් :**

(I) අ.පො.ස (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනක් (03) සමත්ව තිබිය යුතුය.

සහ

(II) (අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මඟින් ස්ථාපිත කර ඇති තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්ෂේත්‍රයේ N.V.Q. 05 වෙනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල/අධ්‍යාපන ආයතන මඟින් විෂය ක්ෂේත්‍රයට අදාලව පිරිනමනු ලබන N.V.Q. 05 සහ N.V.Q. 06 මට්ටමේ හෝ S.L.Q.F. 03 සහ S.L.Q.F. 04 මට්ටමේ ඩිප්ලෝමා සුදුසුකම් ලබා තිබිය යුතුය.

හෝ

(ඇ) පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳ වසරක පළපුරුද්දක් සහිතව ඉහත (II) (අ) සුදුසුකම්වලට සමාන යැයි තෘතයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබා තිබිය යුතුය.

**වැටුප** : *UMT 1 (III) රු. 51,095.00 - 7x540: 10x640 - 60,575.00 (මාසික)*
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් හා/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වයස** : අවුරුදු දහ අටට (18) නොඅඩු සහ හතලිස් පහට (45) නොවැඩි විය යුතුයි.

**4. <u>තාක්ෂණික නිලධාරි (II ශ්‍රේණිය) ආ බණ්ඩය</u>**

**සුදුසුකම්** :

(I) (අ) අ.පො.ස (උ.පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් හෝ තාක්ෂණවේදය විෂය ධාරාවෙන් හෝ විෂයයන් තුනක් (03) එකවර සමත්ව තිබිය යුතුය.

සහ

(ආ) තනතුරට අදාළව, අවම වශයෙන් වසරක කාලසීමාවකින් යුතු (පූර්ණ කාලීනව) හෝ ඊට සමාන කුසලතා කේන්ද්‍රීය විධිමත් පුහුණු වැඩ සටහනක් සම්පූර්ණ කර තිබීම හෝ එයට සමාන සුදුසුකමක් සපුරා තිබීම. මෙම පුහුණු වැඩසටහනේ පිළිගත හැකිබව තීරණය කරනු ලබන්නේ අදාළ පීඨයේ අවශ්‍යතාවය මත වේ.

**වැටුප** : *UMT 1 (III) රු. 51,095.00 - 7x540: 10x640 - 60,575.00 (මාසික)*
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වයස** : වයස අවුරුදු දහ අටට (18) නොඅඩු සහ හතලිස් පහට (45) නොවැඩි විය යුතුයි.

## 5. <u>කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)</u>

සුදුසුකම් :

(I) අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබිය යුතුය.

සහ

(II) අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර).

- පැරණි නිර්දේශය යටතේ විෂයයන් තුනක් (03) ක් පමණක් සමත්වීම ප්‍රමාණවත් වේ.

(III) පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්.

හා

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : *UMN 1 (III) රු. 49,475.00 - 17x540 - 58,655.00 (මාසික)*
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් (සිංහල/ දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම, බුද්ධි පරීක්ෂණය, සාමාන්‍ය දැනුම සහ පරිගණක සාක්ෂරතාවය ඇගයීම සඳහා) හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** : අවුරුදු දහ අටට නොඅඩු (18) සහ වයස අවුරුදු තිහට (30) නොවැඩි.

## 6. <u>වැඩ සහායක (III ශ්‍රේණිය)</u>

## 7. <u>ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය)</u>

## 8. <u>උද්‍යාන සේවක (III ශ්‍රේණිය)</u>

**ඉහත 6,7, සහ 8 තනතුරු සඳහා සුදුසුකම් :**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත් වී තිබීම හා අවම වශයෙන් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : *UPL 1(III) - රු. 42,775.00 - 16x450 - 49,975.00 (මාසික)*
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා/ හෝ වෘත්තීය පරීක්ෂණයක් මගිනි.

**වයස** : වයස අවුරුදු දහ අටට (18) නොඅඩු සහ හතලිස් පහට (45) නොවැඩි.

**සැළකිය යුතුයි :**

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම, තනතුරට අදාළ රාජකාරී කටයුතු ඵලදායී ලෙස ඉටු කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් තිබීම සහ විශිෂ්ට සදාචාරාත්මක චරිතයක් තිබීම, ඉහත සඳහන් සියලු තනතුරු සඳහා බඳවා ගැනීම සළකා බැලීම සඳහා අත්‍යවශ්‍ය සුදුසුකම් වේ.

02. විශ්වවිද්‍යාලයේ භාවිතා වන රාජකාරීමය භාෂා මාධ්‍යයන් සිංහල හා ඉංග්‍රීසි වේ.

**අයදුම්පත් ක්‍රියාපරිපාටිය :**

01. අයදුම්පත් විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන www.vpa.ac.lk වෙතින් බාගත කරගත යුතු අතර නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07"** යන ලිපිනයට 2026.09.04 ප.ව. 4.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර එම අයදුම්පතෙහි PDF පිටපත nae.division@vpa.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතු වේ. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර අනිවාර්යයෙන් පැහැදිලිව සඳහන් කිරීම අනිවාර්ය වේ.

02. අදාළ සහතිකවල පිටපත් අයදුම්කරු විසින් සහතික කර අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වේ.

03. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් නොකිරීම, අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම හා අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් නොකිරීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

04. රාජ්‍ය සේවයේ හෝ සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ අංශ ප්‍රධාන මඟින් එවිය යුතුය.

05. කිසියම් හේතුවක් මත යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප වුවහොත් එම අයදුම්පත නැවත සළකා නොබැලේ.

**ලේඛකාධිකාරී**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
**නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය**
**කොළඹ 07**
**2026.08.11**